# ශ්‍රී ලංකාවේ රාජ්‍ය කාර්මික සංස්ථාවන්හි ඵලදායිතාව වර්ධනය කර ගැනීම සඳහා සන්නිවේදන උපාය මාර්ග

## (COMMUNICATION STRATEGIES FOR PRODUCTIVITY IMPROVEMENT IN PUBLIC SECTOR INDUSTRIAL CORPORATION IN SRI LANKA)

එච්.එම්.එච්. විමලරත්න

කැලණිය විශ්වවිද්‍යාලයේ
ශාස්ත්‍රපති උපාධිය සඳහා
ඉදිරිපත් කරන
නිබන්ධනය

1996

# සාර සංග්‍රහය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය කාර්මික නිෂ්පාදන සංස්ථාවන්හි ඵලදායිතාව වර්ධනය කර ගැනීම සඳහා සන්නිවේදන උපාය මාර්ග ප්‍රස්තුතය කරගෙන නිර්මාණය කළ මෙම නිබන්ධනයට පරිච්ඡේද හතරක් ඇතුළත් ය.

පළමු පරිච්ඡේදයෙන් රාජ්‍ය සංස්ථා පිළිබඳ ව හැඳින්වීමක් කෙරේ. මෙම හැඳින්වීමේ දී රාජ්‍ය අංශය බිහිවීමට ඉංග්‍රීසීන්ගේ වතු වැවිලි වගාව පසුබිම් වූ අයුරු පළමු කොටසිනුත්, දෙවන කොටසින් මෙම සියවසේ රාජ්‍ය මහාපරිමාණ කර්මාන්තවලට යොමුවූ ආකාරයත්, තුන්වන කොටසින් ඒජන්සි ආයතන, දෙපාර්තමේන්තු හා සංස්ථා බිහි කිරීමත්, ඒවාහි විකාශනයත් විස්තර කෙරේ.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

ඉංග්‍රීසීන් විසින් ලංකාවේ වතු වගාව පිණිසත්, එහි සංවර්ධනය සඳහාත්, අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනය කරමින් තවදුරටත් ආර්ථික අංශ ද කළමනාකරණය කරන ලදී. මෙසේ ඉංග්‍රීසි පාලකයින් ලබාදුන් රාජ්‍ය අනුග්‍රහය 'රාජ්‍ය අංශය' හටගැනීමේ කලල අවස්ථාව හැටියට පෙන්වා දී ඇත.

'රාජ්‍ය අංශය බිහිවූයේ 1832 න් පසුවය. කෝල්බෲක් හා කැමරන් යෝජනා ක්‍රියාත්මකවීමත් සමඟ සීමිත වගකීම් සහිත තවත් සමාගම් පිහිටුවන ලදී. මෙකල තේ, රබර්, පොල් වගාවන් ද ආරම්භ කිරීමත් සමඟ ඒ තුළින් දේශීය වැවිලි වගාකරුවන්, ආයෝජකයින් හා ශ්‍රමිකයින් පන්තියක් ද බිහි විය. ව්‍යාපාරික කටයුතු සඳහා රක්ෂණ සමාගම්, කළමනාකරණ සේවා, නැව් සමාගම් ආදිය තැරැව්කරුවන් විසින් පවත්වා ගෙන යන ලදී. නව වැවිලි ආර්ථිකය විසින් සමාජය මුදලට හුරු කළ අතර, එමගින් සමාජ පැවැත්ම ද ගිලගන්නා ලදී. පෞද්ගලික අංශය මූලිකත්වය ගෙන නිරතුරුව ක්‍රියාත්මක වෙමින් 1832 දී තැපැල් සේවය ද, 1845 දී දුම්රිය සේවය ද, 1855 දී ටෙලිග්‍රාෆ් සේවය ද, 1880 දී දුරකථන සේවය ද 1895 දී විදුලි සේවාව ද ආරම්භ කරන ලදී. පසුව රජය විසින් 1861 දී දුම්රිය සේවය ද, 1905 දී දුරකථන සේවය ද, 1924 දී විදුලි බලය ද අත්කර ගනු ලැබිය. රජයේ ඒජන්සි ආයතන වශයෙන් දසක කිහිපයක් පැවැති මෙම සේවා ආයතන පසුව රජයේ දෙපාර්තමේන්තු බවට පත් විය. මෙම දෙපාර්තමේන්තු කොටස් වශයෙන් විවිධව බෙදී ගොස් ප්‍රධාන-රාජ්‍ය ආයතන වශයෙන් දැනුදු ක්‍රියාත්මක වේ.

1833 දී ආණ්ඩුකාරයා පත් කළ ව්‍යවස්ථායක හා විධායක සභාවට සිංහල, දෙමළ, බර්ගර් ජනතා නියෝජනයක් ද තිබුණි. එය තවදුරටත් පුළුල් වෙමින් උඩරට සිංහලයන් හා මුස්ලිම්වරුන් සඳහා ද 1889 දී නියෝජනයක් ලැබුණි. අධ්‍යාපනය වෙළෙඳාම හා ජනගහණය යන අංශවල වැඩි දියුණුවත්, මේ කාලය තුළ දී සිදුවීමත් එම දියුණුවත් සමඟ ම උගත් ලාංකිකයන්ගේ සිතුම්, පැතුම් වල ද වෙනසක් ඇති විය. මෙම කාරණා ද රාජ්‍ය අංශය පුළුල්වීම කෙරෙහි බලපෑවේ ය.

1907 දී පිහිටුවා ගත් පහතරට වැවිලිකරුවන්ගේ සංගමය, දේශපාලන ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට උත්සුක විය. "ලංකා ජාතික සංගමය" මධ්‍යම පන්තික ජනතාවගේ නැගී ආ ව්‍යාපාරයක් විය. මෙම ව්‍යාපාරය ද 1931 සිට 1941 දක්වා දසකය තුළ නව රාජ්‍ය ව්‍යවසාය බිහිවීමටත්, වර්ධනය වීමටත්, රුකුලක් විය. වැවිලි කර්මාන්තය ආශ්‍රිතව කෙමෙන් කෙමෙන් කාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනය විද්‍යාමාන විය. මෙම වර්ධනය වඩාත් කඩිනම් වූයේ දෙවන ලෝක යුද්ධ සමයේ දී ය. යුද්ධ කාලීන අවශ්‍යතා සඳහා භාණ්ඩ නිෂ්පාදනය කඩිනම් විය. එහෙත් පෞද්ගලික අංශය මේ කාර්යයෙහි ලා දායක නොවූයෙන් කාර්මික සංවර්ධන කටයුතු රජයට ම කරන්නට සිදු විය. රජය ඇරඹූ යුද්ධකාලීන කර්මාන්ත යුද්ධය නිමවීමත් සමඟ ම අඩපණ විය. අවසානයේ ශේෂව පැවැතියේ තුනී ලෑලි, පිඟන්, සම් සහ සිමෙන්ති කර්මාන්තය පමණි. ලංකාව ස්වාධීනත්වය ලබන තුරු මෙම තත්ත්වය පැවතුණි.

ඉංග්‍රීසි පාලකයින් උඩරට, පහතරට හා මධ්‍යම ප්‍රදේශවල තේ, පොල්, රබර් වගාව ව්‍යාප්ත කළ නිසා 20 වන සියවස එළඹෙන විට මෙම ද්‍රව්‍යවලට යහපත් අනාගතයක් උදාවිය. වැවිලි කර්මාන්තය ආශ්‍රිතව මෙරට බිහිකරන ලද ප්‍රථම රාජ්‍ය සංස්ථා ආයතනය වූයේ 1909 දී ස්ථාපනය කරනු ලැබූ රබර් පර්යේෂණ ආයතනයයි. ලංකාව ස්වාධීනත්වය ලබන විට ආයතන 8 ක් බිහි වී තිබුණි. රාජ්‍ය කාර්මික යෝජනා ක්‍රම පරිපාලනය සඳහා 1932 දී, කාර්මික හා වාණිජ අමාත්‍යාංශය පිහිටුවන ලදී. එහෙත් රටේ කාර්මික සංවර්ධනයට අවකාශය තිබුන ද, එකල පැවැති ලෝක ආර්ථික අවපාතය බාධාකාරී විය. ලංකාව ස්වාධීනත්වය ලැබූ පසු කාර්මික සංවර්ධනය පිණිස විශාල උනන්දුවක් දැක්වූ බව රජය කෙරෙන් දක්නට තිබුණි. එකල කාර්මික ක්ෂේත්‍රයේ විශාලතම අත්හදා බැලීම වූයේ කන්කසන්තුරේ සිමෙන්ති කම්හල පිහිටුවීමය. එවකට ශේෂව පැවැති පිඟන්, සම්, තුනී ලෑලි' කර්මාන්ත ද ප්‍රතිසංවිධානය මෙකල සිදු විය.

එක්දාස් නවසිය පණස් ගණන්වල ලංකාවේ රාජ්‍ය ව්‍යවසාය ක්‍රියාත්මක වූයේ අත්තිකාරම් ගිණුම් ක්‍රමය යටතේ ය. වාණිජ ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමෙහි ලා මුදල් රෙගුලාසි සහ භාණ්ඩාගාර චක්‍ර ලේඛන හරස් කපන බව පැහැදිලි ව දිස් විය. මේ නිසා රාජ්‍ය කාර්මික ව්‍යවසාය පාලනය කිරීමේ උචිත ක්‍රමය රාජ්‍ය සංස්ථා පිහිටුවීම බව රජය පිළිගත්තෙන් ඒ සඳහා නීති සම්පාදනය කරන ලදී.

1955 අංක. 19 දරන රාජ්‍ය අනුග්‍රාහික කාර්මික සංස්ථා පනත අනුව එවකට ක්‍රියාත්මකව පැවැති කාර්මික ව්‍යවසායයන් ව්‍යවස්ථාපිත මණ්ඩල බවට පත් කරන ලදී. නව කර්මාන්ත ඇරඹීම සඳහා මෙම පනතේ ප්‍රතිපාදන නොවූයෙන් 1957 අංක. 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යනුවෙන් නව පනතක් සම්මත කරනු ලැබීය. මෙම පනතේ තිබූ පුළුල් බලතල අනුව මණ්ඩල, ආයතන, අධිකාරී, සභා යනුවෙන් රාජ්‍ය සංස්ථා ආයතන විශාල සංඛ්‍යාවක් පසුකාලයේ දී ස්ථාපිත කරන ලදී. මේ අයුරින් අභිනව පනත මඟින් රජය මහපරිමාණ කර්මාන්තවලට යොමු විය.

මෙම පරිච්ඡේදයේ තුන්වන කොටසින් දැක්වෙන්නේ රාජ්‍ය සංස්ථා බිහිවීම, විකාශනය හා ක්‍රියාකාරිත්වයයි. 1955 අංක. 19 දරන මුල් පනතට එතරම් බලතල නොවීය. එහෙත් 1957 අංක. 49 දරණ පනතින් ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි ලා රජයේ සහභාගිත්වය, නව ක්ෂේත්‍රවලට යොමු කරන ලදී. මේ අනුව ජනසතු ව්‍යාපාර ආරම්භ කිරීම, නැව් බඩු පැටවීම හා බෑම මණ්ඩලවලලට පවරා ගැනීම ද සිදු විය. දිවයිනේ පෞද්ගලික අංශය සතුව තිබූ ඛණිජ තෙල් වෙළෙඳාම ද ඛණිජ තෙල් සංසථාව යටතට පත්කරන ලදී. ලංකා ගුවන් විදුලි සේවය සංස්ථාවක් බවට පත් කරන ලදී. තව ද, වෙළෙඳාම හා ඉදිකිරීම් කටයුතු සඳහා ද, පර්යේෂණ පැවැත්වීම සඳහා ද, උසස් අධ්‍යාපනය සඳහා විශ්ව විද්‍යාල පිහිටුවීම ද, වාණිජ කටයුතු සඳහා රක්ෂණ හා බැංකු ආයතන පිහිටුවීම ද සිදුකරන ලදී. රාජ්‍ය සංස්ථාවල විකාශනය ඇති වූයේ 1960 සිට 1977 දක්වා කාලය තුළ දී ය. ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා යොදාගත හැකි හොඳ ම ආකාරය රාජ්‍ය සංස්ථා ලෙස එකල පිළිගැනීමක් තිබුණි. එකල රජයේ රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරිත්ව ධාරිතාව පුළුල් කිරීම රජයේ ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන තිබුණි.

නිදහස් ලංකාවේ පැවැති ආර්ථික සෞභාග්‍යය 50 දසකය අවසාන වන විට මැකීයන තත්ත්වයක ලකුණු පහළ වූ අතර, 1956 වන විට රටේ වත්කම් උග්‍ර අවදානමකට පත්ව තිබුණි. මේ වන විට ලංකාව ආනයන ආදේශ උපක්‍රම න්‍යාය භාවිතා කරමින් ප්‍රාථමික නිෂ්පාදන අපනයනය කළ අතර, කාර්මික නිෂ්පාදන භාණ්ඩ ආනයනය කරන ලදී. විදේශීය තරඟකාරිත්වයෙන් දේශීය වෙළෙඳ පල ආරක්ෂා කර ගැනීම සඳහා කඩිනම් කාර්මිකකරණයක් අපේක්ෂා කරන ලදී. 1956 සිට 1965 දක්වා වන තුරු කාර්මිකකරණයේ දක්නට ලැබුණ විශේෂ ලක්ෂණය වූයේ රජයේ නැඹුරුතාවයි. එහෙත් රජය පෞද්ගලික අංශයට ලබාදුන් දිරිගැන්වීම්වල වෙනසක් නොවීය.

ශ්‍රී ලංකාව කාර්මිකකරණය කිරීම සඳහා මූලිකත්වය ගනු ලැබුයේ, රාජ්‍ය සංස්ථාය. එසේ නොවන්නට අද පෞද්ගලිකකරණයක් ද ඇති නොවන්නට ඉඩ තිබුණි. රජය විශාල ප්‍රාග්ධන ආධාර විදේශ රටවලින් ලබාගත්තේය. 1977 වන විට රාජ්‍ය අංශයේ ආයතන 182 ක් විය. එහෙත් මෙම ආයතනවලින් බොහොමයක් ආරම්භ කර කලක් ගතවන විට එ සඳහා ආයෝජනය කළ ප්‍රාග්ධනය හා ලාභ ගලා ඒම අඩු විය. වරින් වර බලයට පත් දේශපාලන පක්ෂවල හිතවතුන් පාලනාධිකාරයට පත් කිරීම නිසා කළමනාකරණය දුර්වල වූ බව මනාව පෙනෙන්නට තිබුණි. විශ්වාසය, අවංකනම, සාධාරණය වැනි ධර්මතාවන්ගේ ප්‍රමාණිකත්වය ද ලිහිල් විය. ආයතනවල කාර්ය සාධකයන් තිබූ බව නොපෙනේ. මේ නිසා 1977 වන විට රාජ්‍ය අංශයේ සංස්ථා ආයතන "සුදු අලින්" යන විරුදාවලිය ලැබිය.

දෙවන පරිච්ඡේදයේ පළමු කොටසින් ඵලදායිතා සංකල්පය හඳුන්වා දෙමින්, ඒ පිළිබඳ අර්ථ නිරූපණයක් කර එය ලංකාවේ භාවිතයට පැමිණි අයුරුත් ඒ මඟින් ආයතනයක ඵලදායිතාව නංවන අයුරුත් විස්තර කෙරේ. අනතුරුව ආර්ථික හා භෞතික ඵලදායිතාව විග්‍රහ කෙරේ.

ආර්ථික, සමාජීය, තාක්ෂණික හා කළමනාකරණ න්‍යායයන් හා ඵලදායිතාව අතර පවත්නා සම්බන්ධතාව ද, විශේෂයෙන් ම එය වර්ධනය කිරීම සඳහා සංවිධානයකට යොදාගත හැකි කළමනාකරණ උපක්‍රම සමඟ, කළමනාකරණ පාදක සිද්ධි අධ්‍යයනයක් ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. මෙම පරිච්ඡේදයේ දෙවන කොටසින් ඵලදායිතාව දියුණු කිරීමට තිබෙන සන්නිවේදන බාධක පිළිබඳව සාකච්ඡා කෙරේ. මෙම සාකච්ඡාවට සංවිධානමය සන්නිවේදනය, ක්‍රියාවලිය, පුද්ගලාන්තර ගැටළු හා වචන භාවිතයේ දී ඇතිවන ගැටළු භාජනය වේ. සංවිධානමය ක්‍රියාකාරිත්වය තුළින් එයට ආවේනික වූ විද්‍යාමාන වන සන්නිවේදන බාධක ද ඒ පිළිබඳව රාජ්‍ය කාර්මික නිෂ්පාදන සංස්ථා ඇසුරෙන් කළ අධ්‍යයනයේ ප්‍රතිඵල ඔස්සේ ඉදිරිපත් කර ඇත.

තුන්වන පරිච්ඡේදය මගින් සන්නිවේදනය හා සන්නිවේදන මාධ්‍යය පිළිබඳව සාකච්ඡා කෙරේ. එම සාකච්ඡාව කෙරී ඇත්තේ, නිබන්ධන ප්‍රස්තුත මාතෘකාවට ප්‍රමාණවත් වන හා අදාළ වන අයුරින් පමණි. ඒ අනුව සන්නිවේදනය කුමක් ද? යන්නත්, සන්නිවේදන ක්‍රම පිළිබඳවත්, එහි ස්වරූපය හා ප්‍රායෝගික කාර්යය පිළිබඳවත් සවිස්තරව දැක් වේ. එසේ ම ආයතනික කටයුතු කෙරෙහි සන්නිවේදන බලපෑම් ඇතිවන ආකාරයත්, සන්නිවේදන මාධ්‍යයන්ගෙන් සැලසෙන දායකත්වයත් විග්‍රහ කර ඇත. සංවිධානයක ක්‍රියාකාරිත්වය කෙරෙහි ප්‍රායෝගිකව සන්නිවේදනය බලපාන ආකාරයත්, සංවර්ධන රටවල සන්නිවේදන කටයුතු ආයතනික ඵලදායිතා සංවර්ධනයට ඉවහල් කරගෙන ඇති අයුරුත්, ශ්‍රී ලංකාවේ විවිධ ආයතන සන්නිවේදන ක්‍රම භාවිතා කරන ආකාරය පිළිබඳවත් සාකච්ඡා කර ඇත..

මෙම නිබන්ධනයේ හතරවන පරිච්ඡේදයේ පළමු කොටසින් රාජ්‍ය සංස්ථාවල පවත්නා පරිපාලන ක්‍රමයත්, ඒ ආශ්‍රිතව පවතින ගැටළුත්, සමීක්ෂණය ආශ්‍රිතව එළිදරව් කරගත් ගැටළු පිළිබඳවත් විස්තර කෙරේ.

මෙහි දෙවැනි කොටසින් ශ්‍රී ලංකාවේ ඵලදායිතාව දියුණු කර ගැනීමට කෙරෙන යෝජනාත් ඒ පිළිබඳ නිර්දේශත් ඉදිරිපත් කෙරේ. එම යෝජනා වලින් හා නිර්දේශ වලින් ඵලදායිතාව වර්ධනය කර ගැනීමට භාවිතා කළ හැකි සන්නිවේදන උපාය මාර්ග දක්වා ඇත.